## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය 2021

# ව්‍යාපාර අධ්‍යයනය සම්මන්ත්‍රණය

01. ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය කවර උපාංගවලින් සමන්විත වේ ද ?

1. මූල්‍ය වෙළෙඳපොළ (Financial market)

   අරමුදල් ඉල්ලුම් කරන්නන් හා අරමුදල් සපයන්නන් සම්බන්ධ කිරීම සඳහා පවත්නා ස්ථානයක්, ආකාරයක් හෝ අවකාශයක් මූල්‍ය වෙළෙඳපොළ යි. මෙහි කෙටිකාලීන හා දිගු කාලීන මූල්‍ය වත්කම් මිල දී ගැනීම සහ විකිණීම සිදු කෙරේ.

   උදා: මුදල් වෙළෙඳපොළ, ප්‍රාග්ධන වෙළෙඳපොළ

2. මූල්‍ය ආයතන (Financial institutions)

   මෙරට මූල්‍ය වෙළෙඳපොළෙහි ක්‍රියාත්මක වන බැංකු හා බැංකු නොවන සියලු ම ආයතන මූල්‍ය ආයතන වේ.

   උදා: බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, ලියාපදිංචි මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, ප්‍රාථමික අලෙවිකරුවන් යනාදිය

3. මූල්‍ය උපකරණ (Financial instruments)

   අරමුදල් රැස් කිරීම සඳහා භාවිත කරන සුරැකුම්පත් මින් අදහස් වේ.

   උදා: භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, සාමාන්‍ය කොටස්, වරණීය කොටස්, වාණිජ පත්‍රිකා, සාංගමික ණයකර යනාදිය

4. මූල්‍ය යටිතල පහසුකම් (Financial infrastructure)

   රටක මූල්‍ය ක්‍රමයේ සංවිධිත ක්‍රියාකාරීත්වය හා ස්ථායිතාව තහවුරු කිරීම සඳහා ආධාර වන ගෙවීම් සහ පියවීම් පද්ධති මින් අදහස් වේ.

   උදා: - තත්කාලීන දළ පියවීම් පද්ධතිය (Real Time Gross Settlement System / RTGSS)
   - නිර්ලේඛන සුරැකුම්පත් පියවීම් පද්ධතිය (Scripless Securities Settlement - [SSS] System)
   - ඡායාගත චෙක්පත් පිළිබිඹු නිෂ්කාශන පද්ධතිය (Image Cheque Clearing / Cheque Truncation System / CTS)
   - ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධති / ස්ලිප්ස් (Sri Lanka Interbank Payment System /SLIPS)
   - ජගත් අන්තර් බැංකු මූල්‍ය විද්‍යුත් සන්නිවේදන සංගමය / ස්විෆ්ට් ක්‍රමය (SWIFT)

5. නියාමන අධිකාරී (Regulating institutions)

   මූල්‍ය ආයතන අධීක්ෂණය හා නියාමනය කරන රාජ්‍ය ආයතන මින් අදහස් වේ.

   උදා: ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව යනාදිය

02. මූල්‍ය උපකරණවල කල්පිරීමේ කාලය පදනම් කරගෙන මූල්‍ය වෙළෙඳපොළ උප වෙළෙඳපොළවල් ද සහිතව වර්ගීකරණය කලහැකි ආකාරය ගැලීම් සටහනකින් දක්වන්න.

මූල්‍ය වෙළෙඳපොළ

- මුදල් වෙළෙඳපොළ
  - අන්තර් බැංකු එක්ෂණ ණය වෙළෙඳපොළ
  - දේශීය - විදේශීය විනිමය වෙළෙඳපොළ
  - භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ
    - භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙළෙඳපොළ
    - භාණ්ඩාගාර බිල්පත් ද්විතීක වෙළෙඳපොළ
  - වාණිජ පත්‍රිකා වෙළෙඳපොළ
- ප්‍රාග්ධන වෙළෙඳපොළ
  - භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළ
  - සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ
  - කොටස් වෙළෙඳපොළ
    - ප්‍රාථමික කොටස් වෙළෙඳපොළ
    - ද්විතීක කොටස් වෙළෙඳපොළ
  - ඒකක භාර වෙළෙඳපොළ

03. පහත සඳහන් මූල්‍ය උපකරණ ඉහත දැක් වූ වෙළෙඳපොළ දෙවර්ගයෙන් කුමකට අයත් වේ දැයි වර්ගකර දක්වන්න.

- ස්වෛරීත්ව බැඳුම්කර
- සාංගමික බැඳුම්කර
- භාණ්ඩාගාර බිල්පත්
- සාමාන්‍ය කොටස්
- භාණ්ඩාගාර බැඳුම්කර
- කොටස් බලපත්‍රය
- වාණිජ පත්‍රිකා
- ඒකක
- වරණීය කොටස්
- ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර

| මුදල් වෙළෙඳපොළ | ප්‍රාග්ධන වෙළෙඳපොළ |
|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | සාංගමික බැඳුම්කර |
| වාණිජ පත්‍රිකා | සාමාන්‍ය කොටස් |
| | කොටස් බලපත්‍රය |
| | ඒකක |
| | වරණීය කොටස් |
| | ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර |
| | ස්වෛරීත්ව බැඳුම්කර |

04. (i) මෑත වර්ෂවල රජය මඟින් වැඩි වශයෙන් නිකුත් කල සුරැකුම්පත් වර්ග කවරේ ද ?

භාණ්ඩාගාර බිල්පත් රු. බිලියන 2590.5
භාණ්ඩාගාර බැඳුම්කර රු. බිලියන 1332.1
ස්වෛරීත්ව බැඳුම්කර ඇ. ඩො. මිලියන 507.0

(ii) ව්‍යාපාර වස්තු (සුරැකුම්පත්), කොටස් සහ ඒකක අතර වෙනස දක්වන්න.

ව්‍යාපාර වස්තු (සුරැකුම්පත්) යනු,
කොළඹ කොටස් හුවමාරුවෙහි ගනුදෙනු වන සාමාන්‍ය කොටස්, වරණීය කොටස්, කොටස් බලපත්‍ර, සංගමික ණයකර හා රජයේ සුරැකුම්පත් වේ.

කොටස් යනු,
සමාගමක මුළු ප්‍රකාශිත කොටස් ප්‍රාග්ධන සමාන පංගුවලට බෙදූ පසු එම එක පංගුවක් කොටසක් ලෙස හැඳින් වේ. කොටස් මඟින් සමාගමක පාර්ශවීය අයිතිය නිරූපණය වේ.

ඒකක යනු ,
ඒකක භාරයක ඇති එක් කොටසක් ඒකක ලෙස හඳුන්වයි.

(iii) රටක ආර්ථිකයේ කැඩපත හෙවත් ප්‍රාථමික දර්ශකය වන්නේ ව්‍යාපාර වස්තු වෙළෙඳපොළයි. පැහැදිලි කරන්න.

කොටස් වෙළෙඳපොළක් යනු කිසියම් රටක දේශීය හා විදේශීය ආයෝජනය ඒකරාශී කරන ස්ථානයකි. රටක ආයෝජන ආර්ථිකයට ඍජුවම බලපායි. ආයෝජනය වැඩිවීම ආර්ථික වර්ධනයට හේතු වේ. ආයෝජන වැඩිවීමෙන් අදහස් කරනුයේ ආර්ථිකය පිළිබඳ ආයෝජකයාගේ ඇති විස්වාසය වැඩිවීමකි.

05. (i) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකවන කොටස් වෙළෙඳපොළ හඳුන්වා එය සැකසී ඇති සංයුතිය සඳහන් කරන්න.

කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව (Colombo Stock Exchange / CSE)

ලැයිස්තුගත පොදු සමාගම්වල කොටස් මිල දී ගැනීම සහ විකිණීමට අවශය ද්විතීක වෙළෙඳපොළ පහසුකම් සපයන ආයතනයයි. මෙය සමාගම් පනත යටතේ ඇති ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ස්ථාපිත කර ඇත.

මෙහි මූලික කාර්යය වනුයේ කොටස් සඳහා ද්විතීක වෙළෙඳපොළක ලෙස කටයුතු කිරීමයි. මෙහි පූර්ණ සාමාජිකයින් ලෙස තැරැව්කාර සමාගම් 15 ක් ක්‍රියාත්මක වේ.

කොළඹ කොටස් වෙළෙඳපොළේ සංයුතිය

කොටස් තැරැවුකාර සමාගම් 15 ක් මෙහි සාමාජිකත්වය දරයි. මෙහි පරිපාලනය අධ්‍යක්ෂක මණ්ඩලයක් මගින් සිදු වේ. අධ්‍යක්ෂ මණ්ඩලය 9 දෙනෙකුගෙන් සමන්විත වේ. ඉන් 5 ක් තැරැව්කාර ආයතන මගින් ද, අනෙක් 4 දෙනා මුදල් අමාත්‍යාංශයේ විසින් ද පත් කෙරේ.

(ii) එම ආයතනයේ කටයුතු අධීක්ෂණය කිරීම සහ විධිමත් කිරීම පිණිස පිහිටුවා ඇති ආයතනය කුමක් ද ?

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
(SEC / Securities & Exchange Commission of Sri Lanka)

06. (i) සීමිත පොදු සමාගමකින් ආයෝජකයින් විසින් සෘජුවම කොටස් මිලදී ගැනීම සිදුකරනු ලබන ආකාර කවරේ ද ?

1. මූලික ප්‍රසිද්ධ නිකුතුව (Initial Public Offer / IPO)

   සමාගමක් පළමුවරට කොටස් නිකුත් කිරීමක් මඟින් මහජනයාට දායක වීමේ ඇරයුම් කිරීමයි.

2. පරිණත ප්‍රසිද්ධ නිකුතුව (Seasoned Public Offer / IPO)

   දැනටමත් කොටස් නිකුත් කර ඇති සමාගමක් සිය ප්‍රාග්ධනය වැඩිකර ගැනීම සඳහා නිකුත් නොකළ කොටස් මහජනයාට නිකුත් කරන අවස්ථාවයි.

(ii) එසේ මිල දී ගත් කොටස් නැවත එකිනෙක අයෝජකයින් අතර ගනුදෙනු සිදුකරන වෙළෙඳපොළ කුමක් ද ?

ද්විතික කොටස් වෙළෙඳ පොළ (Secondary Share Market)

(iii) දැනට ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳපොළ තුළ ලියාපදිංචි ලැයිස්තුගත පොදු සමාගම් ගණන කීයද ?

287 යි.

07. (i) ඕනෑම සමාගමකට කොටස් වෙළෙඳපොළ තුල ලියා පදිංචි විය හැකි ද ?

නොහැක.

(ii) කොටස් වෙළෙඳපොළ තුල ලියාපදිංචි විය හැකි සමාගම් මොනවා ද ?

- සීමිත පොදු සමාගම්
- ව්‍යවස්ථාපිත ආයතන
- අවෘතාන්ත අරමුදල්

08. කොළඹ කොටස් වෙළෙඳපොළ තුල ලියාපදිංචි විය හැකි ආකාරයන් වන දායකත්ව අර්පණය හා විකුණුම් අර්පණය අතර වෙනස සඳහන් කරන්න.

1. දායකත්ව අර්පණයක් මගින් / මූලික ප්‍රසිද්ධ නිකුතුවක් තුළින් / මහජන නිකුතුව තුළින් (Offer for Subscription)

   සීමිත පොදු සමාගමක් නව කොටස් නිකුත් කිරීමක් මගින් මහජනයාට දායක වීමට ඇරයුම් කර කොටස් වෙළඳ පොළේ ලැයිස්තුගත වීමයි.

   උදා ඃ ප්‍රයිම් ලෑන්ඩ් මහජනතාව වෙත කොටස් නිකුත් කරමින් කොළඹ කොටස් වෙළඳ පොළේ ලැයිස්තුගත වීම

2. විකුණුම් අර්පණයක් මගින් / ද්විතීයික නිකුතුව තුළින් (Offer for sale)

   දැනටමත් කොටස් නිකුත් කර ඇති සීමිත පොදු සමාගමක් මහජනයා සතු ව ඇති කොටස්, කොටස් වෙළඳ පොළේ විකිණීමට ඉදිරිපත් කරමින් ලැයිස්තුගත වීමයි.

   උදා ඃ සණස සංවර්ධන බැංකුව දැනට නිකුත් කර ඇති කොටස් මිල දී ගැනීමට මහජනතාවට ආරාධනා කරමින් කොළඹ කොටස් වෙළඳ පොළේ ලැයිස්තුගත කිරීම

09. (i) කොළඹ කොටස් හුවමාරුවෙන් කොටස් මිල දී ගැනීම සඳහා පුද්ගලයෙකුට තිබිය යුතු අවම සුදුසුකම් මොනවා ද ?

   අවුරුදු 18 ට වඩා වැඩි විය යුතුය.

(ii) පුද්ගලයකු කොටස් වෙළෙඳපොළේ ලියාපදිංචි වීමේ දී අනුගමනය කල යුතු ක්‍රියාපටිපාටිය කවරේ ද ?

   CSE App එක හරහා Online ගිණුමක් පියවර 7 ක් යටතේ ඇරඹිය හැක.

   1. පුද්ගලික තොරතුරු (Personal Information) ඇතුලත් කර තැරැවුකාර සමාගමක් තෝරාගන්න.
   2. පදිංචිය පිළිබඳ තොරතුරු (Residental Information) ඇතුලත් කරන්න.
   3. බැංකු ගිණුමේ තොරතුරු (Bank Accounts Details) ඇතුලත් කරන්න.
   4. රැකියාව සම්බන්ධ තොරතුරු (Employment Information) ඇතුලත් කරන්න.
   5. දේශපාලන සම්බන්ධතා (Politically Exposed) ඇතුලත් කරන්න.
   6. ලියවිලි ඇතුලත් කරන්න. (Document Upload)
      - ඉදිරිපස හැඳුනුම්පත් ඡායාරූපය
      - පසුපස හැඳුනුම්පත් ඡායාරූපය
      - බැංකු පොතේ ඡායාරූපය
   7. කොන්දේසි වලට එකඟතාවය පල කිරීම. (CDS ගිණුම ඇරඹීම සම්බන්ධව)

   අඩුපාඩු ඇත්නම් දී ඇති විද්‍යුත් තැපැලට තොරතුරු යවනු ලබයි.

10. (i) කොළඹ කොටස් වෙළෙඳපොළෙහි සීමාසහිත පොදු සමාගම් ලේඛනගත කිරීම සිදුකරන ආකාරය සඳහන් කරන්න.

ප්‍රධාන පුවරුව (Main Board)

දිරිසවි පුවරුව (Diri Savi Board)

**අමතර පුවරු**

සවිබල ගැන්වීම් පුවරුව (Empower Board)

බහුවිධි මුදල් පුවරුව (Muli Currency Board)

දෙවන පුවරුව (Second Board)

වොච් ලිස්ට් (Watch List)

(ii) එහි දී සමාගම් විසින් සපුරාලිය යුතු අවශ්‍යතා මොනවා ද ?

**ප්‍රධාන පුවරුව** (Main Board)

විශාල ප්‍රකාශිත ප්‍රාග්ධනයක් සහිත මනාව ස්ථාපිත වූ සීමිත පොදු සමාගම් ලැයිස්තුගත කිරීම සඳහා වෙන් වූ පුවරුවයි. කොළඹ කොටස් හුවමාරුවේ ලේඛනගත කර ඇති සමාගම් අතුරින් හොඳින් ස්ථාපිත සමාගම් මෙහි ඇතුළත් කරයි.

ප්‍රධාන පුවරුවේ සාමාන්‍ය කොටස් ලැයිස්තුගත වීම සඳහා සීමිත පොදු සමාගමක් විසින් සපුරාලිය යුතු අවශ්‍යතා කිහිපයකි.

A. ලැයිස්තුගත කරන අවස්ථාවේ දී සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන 500 ට නොඅඩු වීම

B. මීට අමතරව පහත පරීක්ෂණවලින් එකක් අදාළ සමාගම සපුරාලිය යුතු ය.

   i. ලාභය සහ ශුද්ධ වත්කම් පරීක්ෂණය
      - ලැයිස්තුගත වීමට ඉල්ලුම් කරන දිනට ආසන්නතම පූර්ව අනුගාමී වසර 3 ක විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව බදු පසු ශුද්ධ ලාභයක් පෙන්නුම් කළ යුතු වීම.

   ii. ආදායම් සහ වෙළඳ පොළ ප්‍රාග්ධනීකරණ පරීක්ෂණය
      - ලැයිස්තුගත වීමට ඉල්ලුම් කරන දිනට ආසන්නතම පූර්ව වසර 3 ක විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමස්ත ආදායම රුපියල් බිලියන 3 ක් වීම.

   iii. ධනාත්මක මෙහෙයුම් මුදල් ප්‍රවාහය (කාරක ප්‍රාග්ධනය සඳහා ගැලපීමෙන් පසු) සහ වෙළඳ පොළ ප්‍රාග්ධනීකරණ පරීක්ෂණය.
      - ලැයිස්තුගත කිරීමට අයදුම්පත් ඉදිරිපත් කරන දිනට පෙර ආසන්නතම අවසන් අනුගාමී වසර දෙකේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව ධනාත්මක මෙහෙයුම් මුදල් ප්‍රවාහයන් පැවතීම

C. ලැයිස්තුගත කිරීමට අයදුම්කරන දිනට ආසන්න පෙර මුදල් වර්ෂය සඳහා වූ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ස්වාධීන විගණන වාර්තාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ගැටලුවක් අවධාරණය කර නොතිබීම.

## දිරිසවි පුවරුව (Diri Savi Board)

සීමිත ප්‍රකාශිත ප්‍රාග්ධනයක් සහිත ව ආරම්භ වූ සීමිත පොදු සමාගම් ලැයිස්තුගත කිරීම සඳහා වෙන් වූ පුවරුවයි.

වෙළඳ පොළේ එතරම් ස්ථාපිත නොවූ සමාගම් ලැයිස්තුගත කිරීම මේ පුවරුව තුළ සිදු වේ. මෙම සමාගම් පසු කාලයේ දී ප්‍රධාන පුවරුවේ ලැයිස්තුගත වීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ගත් විට ප්‍රධාන පුවරුවට ඇතුළත් කිරීම කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව විසින් සහතික කෙරේ.

දිරි සවි පුවරුවේ ලැයිස්තුගත වීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා කිහිපයකි.

A. ලැයිස්තුගත කරන අවස්ථාවේ දී සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන 100 ට නොඅඩු වීම.

B. මීට අමතරව පහත පරීක්ෂණවලින් එකක් අදාළ සමාගම සපුරාලිය යුතු ය.
   i. ධනාත්මක ශුද්ධ වත්කම් පරීක්ෂණය
      - ලැයිස්තුගත වීමට ඉල්ලුම් කරන දිනට ආසන්නතම පෙර වර්ෂයේ විගණනය කළ සමාගමේ ගිණුම් ප්‍රකාශනවලට අනුව ධනාත්මක ශුද්ධ වත්කම් වටිනාකමක් වාර්තා කර තිබීම.
   ii. ආදායම් සහ වෙළඳ පොළ ප්‍රාග්ධනීකරණ පරීක්ෂණය
      - ලැයිස්තුගත වීමට ඉල්ලුම් කරන දිනට ආසන්නතම පෙර වර්ෂය සඳහා සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව රුපියල් මිලියන 350 ක ආදායමක් පැවතීම.

C. ලැයිස්තුගත කිරීමට අයදුම්කරන දිනට ආසන්න පෙර මුදල් වර්ෂය සඳහා වූ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ස්වාධීන විගණන වාර්තාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ගැටලුවක් අවධාරණය කර නොතිබීම.

## සවිබල ගැන්වීම් පුවරුව (Empower Board)

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව හරහා ප්‍රාග්ධනය වැඩි කර ගැනීමට පහසුකම් සලසමින් හඳුන්වා දුන් නව පුවරුවයි.

Phriss world යන සමාගම වර්තමානයේ මෙම පුවරුවේ ලේඛනගත වී ඇත.

සවිබල ගැන්වීමේ පුවරුවේ ලැයිස්තුගත වීමට සපුරාලිය යුතු සුදුසුකම්,

1. ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන 25 වැඩි සහ රු. මිලියන 200 ට අඩු සමාගම්.
2. අයදුම්කල දිනට පෙර මූල්‍ය වරණය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව ධනාත්මක ශුද්ධ වත්කම් පැවතීම.
3. ව්‍යාපාරයේ මෙහෙයුම් ඉතිහාස වසර 2 ක් හෝ ඊට වඩා වැඩි විය යුතු වීම.
4. ව්‍යාපාරයේ මුළු වත්කම් රු. මිලියන 600 ක් හෝ පහළ මුළු වත්කමක් මූලික ලැයිස්තු ගත කිරීමේ අයදුම් පත්‍රය ඉදිරිපත් කරන දිනය වන විට පැවතීම.

## බහුවිධ මුදල් පුවරුව (Muli Currency Board)

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද විදේශ මුදලින් ශ්‍රී ලංකාවේ විදේශ සමාගම්වල කොටස් ලැයිස්තුගත කර වෙළෙඳාම් කළ හැකි විවිධාංගික ආයෝජකයින්ගේ සංචිතයකට ප්‍රවේශ වීමට අවස්ථාව ලබා දෙන පුවරුවයි.

බහුවිධි මුදල් පුවරුවේ ලැයිස්තුගත වීමට සපුරාලිය යුතු සුදුසුකම්,

1. ලැයිස්තුගත කිරීමේ අයදුම්පත ඉදිරිපත් කරන දිනට පවත්නා විනිමය අනුපාතයට පරිවර්තනය කරනු ලද ප්‍රාග්ධනයේ ඇ.ඩො. මිලියන දහයකට නොඅඩු විය යුතුය.
2. ලැයිස්තුගත කිරීමේ දිනට පෙර අවසන් වසර තුන සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව ධනාත්මක ශුද්ධ වත්කම් පැවතීම හෝ විදේශීය ආයතනය මව් ආයතනයක් නම්, ලැයිස්තුගත කිරීමේ අයදුම්පත්‍රයේ දිනට පෙර වහාම අවසන් මූල්‍ය වර්ෂ තුන සඳහා ඒකාබද්ධ විගණනය කරන මූල්‍ය ප්‍රකාශනවලට අනුව ධනාත්මක ශුද්ධ වත්කම් පැවතීම.
3. ලැයිස්තුගත කිරීමේ දිනට පෙර අඛණ්ඩව වසර තුනක් සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව බදු ගෙවීමෙන් පසු ශුද්ධ ලාභයක් පැවතීම.

බහුවිධි මුදල් පුවරුවල කොටස්වල ආයෝජනයට අවසර හිමිවන්නේ පහත පාර්ශ්වයන් සඳහා ය.

1. ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථිර පදිංචිය ඇති අයෝජකයින්
2. ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත ආයතන හෝ සාමූහික ආයෝජන යෝජනා ක්‍රම.

### **වොච් ලිස්ට්** (Watch List)

කොටස් වෙළඳ පොළෙහි ලැයිස්තුගත කිරීමේ කොන්දේසි කඩ කරන හෝ නොපිළිපදින සමාගම් සමාගම්වල නම් දැක්වෙන ලැයිස්තුවයි. මෙය මීට පෙර කඩකළ පුවරුව (Default Board) ලෙස හඳුන්වා ඇත.

සමාගමක් මෙම පුවරුවට මාරු කිරීමට හේතු,

1. නියමිත දිනට වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම
2. නියමිත දිනට කාර්තුමය ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම

- කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව විසින් Real Este Investment trust (SL-REIT) මූර්ත දේපළ වෙළෙඳාම් ආයෝජන භාර නිර්මාණය කිරීමට ඉඩ සලසන රාමුවක් හඳුන්වා දී ඇති අතර එමගින් දේපළ වෙළෙඳාම් සංවර්ධකයින්ට සහ අයිතිකරුවන්ට ආදායම් උත්පාදනය සම්පූර්ණයෙන් ම මාරු කිරීමට අවස්ථාව ලබා දේ.

11. කොළඹ කොටස් හුවමාරුවේ මෙහෙයුම් ක්‍රියාවලිය ප්‍රධාන පද්ධති දෙකක් හරහා සිදු වේ. ඒවා නම් කර පැහැදිලි කරන්න.

1. මධ්‍යම තැන්පතු ක්‍රමය (Central Depository System CDS)

කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවෙහි කොටස් ගනුදෙනු නිෂ්කාශනය සහ ගනුදෙනු බේරුම් කිරීම පිළිබඳ කටයුතු කරන ආයතනයයි. මෙය සීමිත පෞද්ගලික සමාගමක් වන අතර එහි සම්පූර්ණ අයිතිය කොළඹ කොටස් හුවමාරුව සතු වේ. සීමා සහිත මධ්‍යම තැන්පත් ක්‍රම (පෞද්) සමාගම මෙහි පූර්ණ නාමයයි.

කොටස් සහතික පත්‍ර භාවිතයෙන් තොරව ඉලෙක්ට්‍රොනික මාර්ගය හරහා ගනුදෙනු කිරීමේ පහසුකම් මධ්‍යම තැන්පතු ක්‍රමය මගින් සළසා ඇත. මධ්‍යම තැන්පතු ක්‍රමයේ ප්‍රධාන කාර්යය වන්නේ මිල කළ සමාගම්හි සුරැකුම්පත් ගනුදෙනුවනතාක් ඒවායේ භාරකරුවකු හැටියට කටයුතු කිරීම හා ආරක්ෂකයෙකු හැටියට කටයුතු කිරීමයි.

මධ්‍යම තැන්පතු ක්‍රමයේ කාර්යයන් (Functions of CDS)

මධ්‍යම තැන්පතු ක්‍රමයේ කාර්ය හා මෙහෙයුම් කිහිපයකි.

A. ආයෝජකයින්ගේ ගිණුම් සේවා

1. ගනුදෙනුකරුවන් සඳහා ගිණුම් විවෘත කිරීම / ගනුදෙනුකරුවන් ලියාපදිංචි කිරීම
2. කොටස් තැන්පත් කිරීම
3. කොටස් පැවරීම සහ නම් කිරීම
4. විද්‍යුත් සේවා
5. තොරතුරු සේවා
   - ගනුදෙනුකරුවන් වෙත මාසික, කාර්තුමය සහ වාර්ෂික වාර්තා යැවීම

B. සුරැකුම්පත් බේරුම් කිරීම

1. සාමාන්‍ය කොටස් බේරුම්කරණය
2. ණය සුරැකුම්පත් බේරුම්කරණය
3. පොදු සේවා

C. සමාගම් සඳහා සහයෝගී විසඳුම් සේවා

1. ලාභාංශ සේවා
2. කොටස්හිමියන් සම්බන්ධ සේවා
   - නීති සේවා, සහතික සේවා

2. ස්වයංක්‍රීය වෙළෙඳාම් ක්‍රමය (Automated Trading Systems / ATS)

අන්තර්ජාලය හරහා පරිගණකගත කරන ලද සුරැකුම්පත් අලෙවියට අදාළ ගනුදෙනු සිදු කරන ඉලෙක්ට්‍රොනික් ක්‍රමයයි. ගනුදෙනුව සිදුවන වේලාවේ ම ක්‍රියාත්මක වන, දෝෂවලින් තොර, කාර්යක්ෂම, විනිවිදභාවය සහිත මෙම ක්‍රමය සුරැකුම්පත්වල ද්විතීයික වෙළෙඳ ගනුදෙනු සඳහා ක්‍රියාත්මක වේ.

ස්වයංක්‍රීය වෙළෙඳාම් ක්‍රමය (ATS) මගින් අත්වන ප්‍රතිලාභ

1. ගනුදෙනු පියවීම වේගවත් ව සිදු කිරීම.
2. කාල ප්‍රමුඛතාව ඇතිව මිල මත ඇණවුම් සම්මුඛ කිරීම. (PriceTime Priority)
3. අලෙවි වන කොටස් ප්‍රමාණයන් හා මිල පිළිබඳ තොරතුරු සැපයීම.
4. කොටස් වෙළඳ පොළ දර්ශක අන්තර්ජාලය මගින් ඉදිරිපත් කිරීම.
5. සමාගම්වල තොරතුරු / ප්‍රකාශ ප්‍රසිද්ධ කිරීම.
6. පොරොත්තු ඇණවුම් පිළිබඳ විස්තර සැපයීම.

12. කොටස් වෙළෙඳපොළ කාර්යය සාධනය මැනීම සඳහා යොදා ගන්නා මිල දර්ශක (Price Index) මොනවා ද ?

i. සියලු කොටස් මිල දර්ශකය (All Share Price Index)

කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ලැයිස්තුගත සමාගම් සියල්ලේ ම සාමාන්‍ය කොටස්වල (ඡන්ද බලය සහිත හා රහිත) මිල ගණන්හි ඇති වන උච්චාවචන / සංචලන පෙන්නුම් කරනු ලබන මිල  දර්ශකය සියලු කොටස් මිල දර්ශකය යි.

මෙම මිල දර්ශකය තුළින් කොටස් වෙළඳ පොළෙහි සමස්ත කොටස් මිල ගණන්වල හැසිරීම පිළිබඳ ව අවබෝධයක් ලබාගත හැක. මෙම දර්ශකය සඳහා වෙළඳ පොළ ප්‍රාග්ධනීකරණය යොදාගනු ලබන අතර එය සකස් කර ඇත්තේ 1985 වසරේ සාමාන්‍ය දෛනික මුළු වෙළඳ පොළ ප්‍රාග්ධනීකරණය, පාදක වටිනාකම ලෙසත්, පාදක දර්ශක අගය 100 ක් ලෙසත් සැලකීමෙනි. 1985 ජනවාරි 02 වැනි දින සිට සෑම වෙළෙඳ දිනයක් සඳහා ම මෙම මිල දර්ශකය ගණනය කරනු ලැබේ. වෙළෙඳ සැසිවාර තුළ ගනුදෙනුවන යාවත්කාලීන දත්ත මත පදනම් ව මෙය ගණනය කරනු ලැබේ. මෙම මිල දර්ශකය ඉහළ යන විට කොටස් ඉල්ලුම වැඩි වී කොටස් වෙළඳ පොළ ක්‍රියාකාරී බවත්, පහළ යන විට කොටස් විකිණීමේ ප්‍රවණතාව වැඩි වී කොටස් වෙළඳ පොළ මන්දගාමී බවක් විග්‍රහ කෙරේ.

ගණනය කරන ආකාරය

$$\text{සියලු කොටස් මිල දර්ශකය} = \frac{\text{වර්තමාන වෙළඳ පොළ ප්‍රාග්ධනීකරණය}}{\text{පාදක වෙළඳ පොළ ප්‍රාග්ධනීකරණය}} \times 100$$

ii. S&P ශ්‍රී ලංකා 20 මිල දර්ශකය (S&P Sri Lanka 20 index)

කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ විශාලත ම සහ වඩාත් ද්‍රවශීල සමාගම් 20ක මිල ගණන්වල වෙනස්වීම මැනීම සඳහා ගණනය කරනු ලබන මිල දර්ශකයයි. තෝරාගත් ප්‍රමුඛ පෙළේ සමාගම් හි කොටස්වල සාමාන්‍ය මිල මට්ටමෙහි හැසිරීම දැනගෙන අනාගත කොටස් ආයෝජනය පිළිබඳ තීරණ ගැනීමට හැකි වීම නිසා මෙම දර්ශකය ආයෝජකයින්ට ප්‍රයෝජනවත් වේ. මෙම දර්ශකයේ අගය 1000 ට වඩා ඉහළ යන විට සමස්ත වශයෙන් දර්ශකයට ඇතුළත් කොටස්වල මිල ඉහළ යාමක් පෙන්නුම් කරයි.

මෙම දර්ශකය සඳහා භාවිත කරන නිර්ණායක

1. සමාගමේ විශාලත්වය (Size of the company - වෙළඳ පොළ ප්‍රාග්ධනීකරණය සැලකිල්ලට ගැනීම. වෙළඳ පොළ ප්‍රාග්ධනීකරණය මිලියන 500 ට වැඩි ඉහළ ම සමාගම් 20 ඇතුළත් කෙරේ.
2. ද්‍රවශීලතාව (Liquidity) - මාස 6 ක කාලයක් තුළ වාර්තා වූ දෛනික සාමාන්‍ය පිරිවැටුම සැලකිල්ලට ගැනීම. අවම වශයෙන් මිලියනයක් විය යුතුය.
3. මූල්‍ය ශක්තිය / ශක්‍යතාව (Financial capability) - පෙර වර්ෂයේ වාර්තා කළ ශුද්ධ ආදායම / ලාභය සැලකිල්ලට ගැනීම.

ඉහත සාධක මත සමාගම් 20 ක් යොදා ගැනීම. මාස 6 කට වරක් සමාගම් සමාලෝචනය කිරීම. පාදක දිනය 2004 දෙසැම්බර් 17 ලෙසත්, පාදක අගය 1000 ක් ලෙසත් සළකනු ලැබීම. 2012 ජුනි 27 වන දින මෙය වෙළඳ පොළට හඳුන්වා දෙන ලදි.

ගණනය කරන ආකාරය

$$\text{S\&P ශ්‍රී ලංකා 20 මිල දර්ශකය} = \frac{\text{තෝරාගත් සමාගම් 20 හි වර්තමාන වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය}}{\text{තෝරාගත් සමාගම් 20 හි පාදක දිනයේ වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය}} \times 100$$

iii. මුළු ප්‍රතිලාභ දර්ශකය (Total Return Index)

කොටස්වල මිල වෙනස් වීම සහ ලාභාංශ ආදායම යන සාධක දෙකෙහිම ප්‍රතිලාභ පෙන්නුම් කරන දර්ශකයයි. එනම් නිශ්චිත කාලසීමාවක් තුළ කොටස්වල මිල වෙනස් වීම නිසා ඇති වන ප්‍රාග්ධන ලාභ හෝ අලාභ සහ හිමි වූ ලාභාංශ ප්‍රමාණය සැලකිල්ලට ගෙන සකස් කරනු ලබන දර්ශකයයි. මෙය සියලු කොටස් සඳහා මෙන්ම S & P ශ්‍රී ලංකා 20 කොටස් සඳහා වෙන් වෙන් ව ගණනය කරනු ලබයි. 2004 ජනවාරි 2 වැනි දා සිට සෑම වෙළෙඳ දිනයක් සඳහා ම මෙම දර්ශකය ප්‍රකාශයට පත් කරයි.

- සියලු කොටස් මිල දර්ශකය මුළු ප්‍රතිලාභ යන පදනම මත ගණනය කළ විට සියලු කොටස් මුළු ප්‍රතිලාභ දර්ශකය (ASTRI) ලෙස හැඳින්වේ.
- S & P ශ්‍රී ලංකා 20 මිල දර්ශකය, මුළු ප්‍රතිලාභ යන පදනම යටතේ ගණනය කළ විට S & P ශ්‍රී ලංකා 20 මුළු ප්‍රතිලාභ දර්ශකය (S&PTRI) ලෙස හඳුන්වයි.

13. මෙරට කොටස් වෙළෙඳපොළ ඉතිහාසය තුල සියලු කොටස් මිල දර්ශකයේ ඉහළම අගය ලෙස ඒකක 8812.01 ක් 2021 ජනවාරි 27 වෙනිදා පෙන්නුම් කලද, 2021 අගෝස්තු 26 වෙනිදා එය ඒකක 8920.71 ක තවදුරටත් ඉහළ යන ලදී. ඊට හේතු කවරේ ද ?

1. කොටස් වෙළෙඳපොළේ නව අයෝජන ලෙස දේශීය ආයෝජකයින් පෙරට ඒම.
2. මූල්‍ය වෙළෙඳපොළේ බැංකු ගාස්තු හා පොලී අනුපාත පහළ අගයක් පැවතීම.
3. උද්ධමනය 5% හා 7% අතර මට්ටමක පැවතීම.
4. අන්තර්ජාතික මූල්‍ය අරමුදලෙන් ඇ.ඩො. මිලියන 780 ක මුදල් ලැබීම.

14. වසංගත තත්ත්වය හමුවේ කොටස් වෙළෙඳපොළේ ''වෙළෙඳපොළ නැවතුම'' දක්නට ලැබුණි. මින් අදහස් වන්නේ කුමක් ද ?

**පළමු පරිපථ කඩනය**

කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ (CSE) දිනය සඳහා වෙළඳාම ආරම්භ කිරීමෙන් පසු S&P SL 20 දර්ශකය 5% කින් පහත වැටුනහොත් මිනිත්තු 30 ක් සඳහා වෙළෙඳපොළ අත්හිටුවනු ලබයි.

**දෙවන පරිපථ කඩනය**

S&P SL 20 දර්ශකය 5% කින් පහත වැටීමෙන් පසු ඇති වූ මිනිත්තු 30 ක සිසිලන කාලයෙන් පසු නැවත වෙළඳාම ආරම්භ කිරීමෙන් අනතුරුව, S&P SL 20 දර්ශකය තවත් 2.5% කින් පහත වැටුණහොත් තවත් විනාඩි 30 ක් සඳහා වෙළෙඳපොළ අත්හිටවනු ලබයි.

**තෙවන පරිපථ කඩනය**

S&P SL 20 දර්ශකය 2.5% කින් පහත වැටීමෙන් පසු (සමස්තයක් ලෙස S&P SL 20 දර්ශකය 7.5% පහත වැටී ඇත.) මිනිත්තු 30 ක සිසිලන කාලයෙන් පසු වෙළෙඳාම නැවත ආරම්භ කිරීමෙන් අනතුරුව තවත් 2.5% කින් S&P SL 20 දර්ශකය පහත වැටුනේ නම් (S&P SL 20 දර්ශකය දවසේ මුළු අගය 10% කින් පහත වැටී ඇත.) වෙළෙඳාම නවත්වන අතර එම දවසම සඳහාම වෙළෙඳපොළ වසා දැමිය යුතුයි.

15. කොටස් මිල ගණන් වල උත්පාත හා අවපාත සිදුවන අවස්ථාවන් පදනම් කර ගනිමින් ගොඩනැගෙන වෙළෙඳපොළ තත්ත්වයන් කවරේ ද ?

ගැනුම්බර වෙළඳ පොළ හෙවත් වෘෂභ වෙළඳ පොළ (Bullish / Bull Market) සහ විකුණුම්බර හෙවත් වලසා වෙළඳ පොළ (Bearish / Bear Market)

කොටස් වෙළඳ පොළෙහි සමස්තයක් වශයෙන් කොටස් මිල ගණන් ඉහළ යමින් පවත්නා තත්ත්වයක් වෘෂභ හෙවත් ගැනුම්බර වෙළඳ පොළ ලෙස හැඳින්වේ. මෙවැනි අවස්ථාවක දී නුදුරු අනාගතයේ දී කොටස් මිල තවත් ඉහළ යන බවටත් එසේ ඉහළ ගිය විට කොටස් විකිණීමෙන් අධි ලාභ ලැබීමටත් බලාපොරොත්තු වන බැවින් ආයෝජකයෝ කොටස් මිල දී ගැනීමට උත්සුක වේ. වෘෂභයන් ක්‍රියාකාරී අවධියේ කොටස් වෙළඳ පොළේ උත්පාතයක් දක්නට ලැබේ.

සමස්තයක් වශයෙන් කොටස් මිල ගණන් පහළ යමින් පවත්නා තත්ත්වයක් වලසා හෙවත් විකුණුම්බර වෙළඳ පොළක් ලෙස හැඳින්වේ. මෙහිදී කොටස් මිල තවත් අඩුවනු ඇතැයි අපේක්ෂා කරන ආයෝජකයෝ කොටස් විකිණීමට නැඹුරු වන අතර කොටස් මිල තවත් පහළ ගිය විට මිල දී ගැනීමෙන් අලාභය අවම කිරීමට බලාපොරොත්තු වේ. වලසුන් ක්‍රියාකාරී අවධියේ කොටස් වෙළඳ පොළේ අවපාතයක් දක්නට ලැබේ.

16. ලෝකයේ විශාල ලෙස ගනුදෙනු සිදුවන කොටස් වෙළෙඳපොළවල් කවරේ ද ?

| | | |
|---|---|---|
| ඇමරිකාවේ | - | New York Stock Exchange |
| ඇමරිකාවේ | - | Nasdaq |
| චීනයේ | - | Shanghai Stock Exchange |
| ජපානයේ | - | Japan Exchange Group |
| හොංකොන් | - | Hongkong Stock Exchange |
| බ්‍රිතානය | - | London Stock Exchange |
| ඉන්දියාව | - | Bombay Stock Exchange |

17. කොටස් වෙළෙඳපොළ තුළ කොටස් තැරැවුකරුවන්ගෙන් ඉටුවන කාර්යයභාරය දක්වන්න.

**ආයෝජකයින්ට**

1. ආයෝජකයන් වෙනුවෙන් මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගිණුම් විවෘත කිරීම.
2. ආයෝජකයන්ගේ ගැනුම් ඇණවුම් හා විකුණුම් ඇණවුම් භාර ගැනීම / ද්විතීයික වෙළඳ පොළ කටයුතු.
3. කොටස් හා ණයකරවල ආයෝජනය සම්බන්ධ උපදෙස් ආයෝජකයින්ට සැපයීම.
4. කොටස් වෙළඳ පොළ විශ්ලේෂණ කටයුතු සිදු කිරීම.
5. වෙළඳ පොළ සමීක්ෂණ වාර්තා සැකසීම මගින් ආයෝජකයින්ගේ ප්‍රතිලාභ උපරිම කිරීම සහතික කිරීම.
6. වෙළඳ පොළ ගනුදෙනු බේරුම් කිරීමේ කටයුතු ඉටු කිරීම.
7. කොටස් තැන්පතු භාර ගැනීම, කොටස් පැවරීම සිදු කිරීම, ගිවිසුම් සටහන් සැකසීම යන ලියවිලි හා බැඳුණු කටයුතු ඉටු කිරීම.
8. ආයෝජන අරමුදල් පාලනය / ආයෝජන කටයුතු.

**මිලකළ සමාගම්වලට**

9. සමාගම් ලැයිස්තුගත කිරීමට අනුග්‍රහය දැක්වීම.
10. සීමාසහිත පොදු සමාගම්වලට ප්‍රාග්ධන සම්පාදනය සඳහා සහාය වීම.
11. නව නිකුතුව / ප්‍රාථමික කොටස් නිකුතුව සම්බන්ධයෙන් සහාය සැපයීම හා ඒ පිළිබඳ තොරතුරු වෙළඳ පොළ වෙත බෙදා හැරීම.
12. හිමිකම් නිකුතුව පිළිබඳ සීමිත පොදු සමාගම්වලට උපදෙස් දීම.
13. සමාගම් ඒකාබද්ධ කිරීමේ දී අවශ්‍ය උපදෙස් දීම.